# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2288/10 - 2022 ජූලි මස 12 වැනි අඟහරුවාදා - 2022.07.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### අතුරු ව්‍යවස්ථාව

අරණායක ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 69/126 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 122 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අරණායක ප්‍රාදේශීය සභාව විසින් සාදනු ලැබූ හා 2019.05.25 දින පැවති එකී ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ අංක 22 දරන යෝජනාව මගින් සම්මතව ඇති මෙහි පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123(1) වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ පළාත් සභාවේ ආණ්ඩුකාරවර ටිකිරි කොබ්බෑකඩුව වන මවිසින් අනුමත කරන ලද බවත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මකවන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ටිකිරි කොබ්බෑකඩුව,**
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

2022 මැයි මස 31 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

**අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉඩම් අනු බෙදුම් කිරීම පරිපාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(vi) උපවගන්තිය යටතේ බලය ලැබී ඇත.

2. මෙම අතුරු ව්‍යවස්ථාව, සබරගමුව පළාතේ, අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 1915 අංක 19 දරන නිවාස හා නගර සංවර්ධන ආඥාපනත ක්‍රියාත්මක වන බල ප්‍රදේශය තුළ ඉඩම් අනුබෙදුම් කිරීම, අනුබෙදුම් කරන ලද ඉඩම් කොටස්

1A - PG 5888 — 07 (2022/07)
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සංවර්ධනය කිරීම, පවත්වාගෙන යාම විධිමත් කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම ඊට ආනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලසීම සඳහා පනවනු ලබයි.

3. මෙම අතුරු ව්‍යවස්ථාව අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉඩම් අනුබෙදුම් පරිපාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වෙයි.

4. සබරගමුව පළාතේ අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් අනුබෙදුම් කරන සෑම තැනැත්තෙක්ම ඊට අදාළ අනුබෙදුම් සැලැස්ම අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට පූර්වයෙන් එකී ඉඩම පිහිටි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාළ ප්‍රාදේශීය සභාවෙහි එකී කාර්යය සඳහා ලියාපදිංචි විය යුතු ය.

5. ඉහත 4 වන වගන්තිය යටතේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීමේදී මෙහි 1 වන උපලේඛනයෙහි සඳහන් ඉල්ලුම් පත්‍රය යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතු ය.

6. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලියාපදිංචි වීමේ කාර්යය සඳහා අනුබෙදුමට අදාළ දේපළ සඳහා සංවර්ධන බලපත්‍රය ලබා ගැනීම වෙනුවෙන් කළ යුතු සංවර්ධන කාර්යයන් සම්බන්ධයෙන් අරණායක ප්‍රාදේශීය සභාවේ තාක්ෂණික නිලධාරි විසින් කරනු ලබන ඇස්තමේන්තු කිරීම් මත, ඇස්තමේන්තු වටිනාකමින් 50%කට සමාන මුදලක් තැන්පත් මුදලක් වශයෙන් ඉල්ලුම්කරු විසින් ප්‍රාදේශීය සභාවෙහි තැන්පත් කළ යුතු ය.

7. අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 1915 අංක 19 දරන නිවාස හා නගර සංවර්ධන ආඥාපනත ක්‍රියාත්මක බල ප්‍රදේශය තුළ ඉඩම් අනුබෙදුම් සඳහා වන සෑම සැලසුමක්ම 1915 අංක 19 දරන නිවාස හා නගර සංවර්ධන ආඥාපනත යටතේ හා මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අනුමත සැලැස්මක් විය යුතු ය.

8. අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 1915 අංක 19 දරන නිවාස හා නගර සංවර්ධන ආඥාපනත ක්‍රියාත්මක බල ප්‍රදේශය තුළ ඉඩම් අනුබෙදුම් කිරීමේ දී අනුබෙදුම් කරන ලද අනුමත සැලැස්මට අදාළව අවස්ථාවෝචිත පරිදි 1915 අංක 19 දරන නිවාස හා නගර සංවර්ධන ආඥාපනත යටතේ හා මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අනුකූලතා සහතිකයක් සභාපතිවරයාගෙන් ලබා ගන්නා තෙක්, අනුබෙදුම් කරන ලද කිසිදු ඉඩම් කොටසක් විකිණීම, බැහැර කිරීම හෝ විකිණීම සඳහා ප්‍රසිද්ධියේ ප්‍රචාරණය කිරීම කිසිදු තැනැත්තෙකු විසින් හෝ නොකළ යුතු ය.

9. අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 1915 අංක 19 දරන නිවාස හා නගර සංවර්ධන ආඥාපනත අදාළ වන බල ප්‍රදේශය තුළ විකිණීම සඳහා අනුබෙදුම් කරන හෙක්ටයාරයකට වඩා වැඩි ඉඩම් සම්බන්ධයෙන් අනුබෙදුම් කරන ලද කුඩාම ඉඩම් කොටස පර්චස් 40කට වඩා අඩු වන්නේ නම්, එම ඉඩම් සම්පූර්ණ ප්‍රමාණයෙන් අභ්‍යන්තර පාරවල් සඳහා වෙන් වූ ප්‍රමාණය අත්හැර ඉතිරි වන බිම් ප්‍රමාණයෙන් 10%ක් පොදු පහසුකම් සඳහා වෙන් කර එම ප්‍රමාණය නිසි සාධන පත්‍රයක් යටතේ අරණායක ප්‍රාදේශීය සභාවට ඉඩමේ අයිතිකරු විසින් තෑගි දිය යුතු ය.

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලියාපදිංචි ඉල්ලුම්කරු,

(අ) අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 1915 අංක 19 දරන නිවාස හා නගර සංවර්ධන ආඥාපනත ක්‍රියාත්මක බල ප්‍රදේශය තුළ ඉඩම් අනුබෙදුමකට අදාළ අභ්‍යන්තර මාර්ග, ප්‍රාදේශීය සභාවෙහි සැලසුම් කමිටුවක් හෝ භෞතික සැලසුම් කමිටුවක නිර්දේශය පරිදි, සභාපති විසින් දෙන උපදෙස් ප්‍රකාරව නිසි ප්‍රමිතීන්ට අනුව සංවර්ධනය කළ යුතු ය.

(ආ) වර්ෂා ජලය බැස යන අභ්‍යන්තර කාණු පද්ධතිය ප්‍රධාන ජල බැස්මකට සම්බන්ධවන පරිදි සභාපති විසින් දෙනු ලබන උපදෙස් ප්‍රකාරව නිසි ප්‍රමිතීන්ට අනුව සංවර්ධනය කළ යුතු ය.

(ඇ) සෑම ඉඩම් කොටසකට අදාළවම අයිතිවාසිකම් බැහැරවන තෙක් කිසිදු පාර්ශ්වයකට පීඩාවක් නොවන සේ ඉතිරි ඉඩම් කොටස් පවත්වා ගත යුතු ය.

(ඈ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තියෙහි කාර්යය සඳහා ඉඩම් කොටස් විකිණීමට අදාළ ප්‍රතිෂ්ඨාවන් සම්බන්ධයෙන් ලේකම් වෙත වාර්තා කළ යුතු ය.

11. ඉඩම් අනුබෙදුමකට අදාළව 1915 අංක 19 දරන නිවාස හා නගර සංවර්ධන ආඥාපනත යටතේ සභාපති විසින් අනුකූලතා සහතිකයක් නිකුත් කිරීමෙන් පසු ඊට අදාළ ඉඩම් අනුබෙදුම් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවෙහි සැලසුම් කමිටුවෙහි හෝ භෞතික සැලසුම් කමිටුවෙහි නිර්දේශ වාර්තාවෙහි සහතික පිටපතක් සහිතව සභාපති විසින් අනුකූලතා සහතිකය නිකුත්

කළ දිනයේ සිට සතියක් ඇතුළත ප්‍රාදේශීය සභා ලේකම් විසින් දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත වාර්තා කළ යුතු ය.

12. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලියපදිංචිය සඳහා ඉල්ලුම් කළ අය විසින් අනුබෙදුම් සැලැස්මට අදාලව අනුකූලතාවය ලැබීමෙන් පසු එහි සහතික පිටපතක් සහිතව තැන්පත් මුදල් ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉල්ලුම් කළ හැකි අතර, දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් අදාළ අනුබෙදුම් සම්බන්ධයෙන් නිසි ආකාරයෙන් කටයුතු සිදු වී ඇති බවට සෑහීමකට පත්වෙමින් අදාළ තැන්පත් මුදල් ඉල්ලුම්කරුගේ ඉල්ලීම් මත නිදහස් කිරීමට සභාපතිවරයාට උපදෙස් දිය යුතු ය.

13. ඉල්ලුම්කරු අනුකූලතාවය සඳහා අයෝග්‍යවන විටක දී හා ඒ අනුව ඉල්ලුම්කරු විසින්ම ස්වකීය අයදුම්පත්‍රය ඉල්ලා අස්කර ගැනීමට ක්‍රියාත්මකවන විටක දී ඉහත 12 වන වගන්තිය යටතේ සඳහන් ආකාරයට අදාළ තැන්පත් මුදල් ඉල්ලුම්කරුගේ ඉල්ලීම මත නිදහස් කිරීම සිදු කළ යුතු අතර, ඒ අනුව අදාළ ලියාපදිංචිය අවලංගු කළ යුතු ය.

14. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම්කළ අය විසින් තැන්පත් මුදල්, තැන්පත් කළ දිනෙන් වසර 3ක කාල සීමාවක් තුළ දී ඉහත 12 වගන්තිය හෝ 13 වන වගන්තිය යටතේ ආපසු ලබා ගැනීමට අපොහොසත්වන විටක දී එම මුදල ප්‍රාදේශීය සභා අරමුදලෙහි ආදායමට බැර කළ යුතු ය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක්වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානයක් යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

16. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අවස්ථා දෙකක දී වරදකරුවන තැනැත්තකු අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ එම කාර්යය සඳහා අයෝග්‍ය අයකු ලෙස අසාධු ලේඛනගත යළ යුතු ය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක අවශ්‍ය වන්නේනම් මිස,

"සභාපති" යන්නෙන් අරණායක ප්‍රාදේශීය සභාවේ සභාපති ද,

"ලේකම්" යන්නෙන් අරණායක ප්‍රාදේශීය සභාවේ ලේකම් ද,

"ඉල්ලුම්කරු" යන්නෙන් යම් ඉඩමක් සම්බන්ධයෙන් අයිතිකරු හෝ අයිතිකරු වෙනුවෙන් ඉදිරිපත් වන සංවර්ධනකරුවකු ද අදහස් වේ.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙමළ හා ඉංග්‍රීසි පිටපත්වල අර්ථය සම්බන්ධයෙන් නොගැලපීමක් ඇති වුවහොත් සිංහල පිටපත වලංගු වන්නේ ය.

### 1 වන උපලේඛනය

ඉඩම් අනුබෙදුම් වෙනුවෙන් ලියාපදිංචි වීම සඳහාවන අයදුම්පත්‍රය.

1. අයදුම්කරුගේ නම/සමාගමක්වන විටක දී සමාගමේ නම ඃ
2. අයදුම්කරුගේ ලිපිනය ඃ
3. අයදුම්කරුගේ හැඳුනුම්පත් අංකය ඃ
4. අයදුම්කරුගේ දුරකථන අංකය ඃ විද්‍යුත් තැපැල ඃ

5. අයදුම්කරු ඉඩම් අයිතිකරු ද නැතහොත් සංවර්ධනකරු ද යන වග ඃ

6. අයදුම්කරු අයිතිකරු නොවන විටක දී අයිතිකරුගේ නම, ලිපිනය ඃ
(ඉල්ලුම්කරු හා අයිතිකරු අතර කාර්යයට අදාළව ඇති ගිවිසුමෙහි පිටපතක් ඉදිරිපත් කළ යුතු ය)

7. ඉඩම පිහිටි දිස්ත්‍රික්කය ඃ

8. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඃ

9. ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඃ

10. අදාළ ඉඩම් ඔප්පුවේ අංකය, නීතීඥ/නොතාරිස් නම (පිටපතක් ඉදිරිපත් කළ යුතු ය) ඃ

11. අදාළ සැලැස්මේ අංකය (පිටපතක් ඉදිරිපත් කළ යුතු ය) ඃ

12. ඉඩම් කොටස් කිරීමට නියමිත කැබලි සංඛ්‍යාව ඃ

13. පළමු ලියාපදිංචියක් ද නැතහොත් පෙර ලියාපදිංචි ලබාගෙන තිබේ දඃ

14. සබරගමුව පළාත තුළ මීට පෙර ඉඩම් අනුබෙදුම් කර විකිණීම පිළිබඳ ලබා ඇති පළපුරුද්ද පිළිබඳ (පසුගිය වසර පහක) වර්ෂය,
    ප්‍රාදේශීය සභාව,
    ඉඩමේ නම,
    ඉඩමේ ප්‍රමාණය

ඉහතින් දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

........................... ...........................
දිනය ඉල්ලුම්කරු

EOG 07 - 0058

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.